# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 සැප්තැම්බර්
මානවශාස්ත්‍ර පීඨය

## සිංහල
### චිරන්තන සිංහල පද්‍ය කාව්‍ය හා විචාර කලාව SINH – E3015

පළමු කොටසේ පළමු ප්‍රශ්නයත්, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගිනුත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

## 1 කොටස

01. පහත දැක්වෙන පද්‍ය උද්ධෘතවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

අ.

පිවෙල් ගෙනයින් මෙ සිරිබර්නි මයි ආ රසා
බැලුමො ගුයුන බ(ල)ත් බෙයන්ද්හි රන්වනුන්
දුට්මො

බැලුමො රිසිසෙයි බෙයන්ද්හි මේ හිරියැත්ත
දකුත් මෙ තොස් දි නැමි එ අතින් මල්දමක්
ගත්තී

(නො දෙ) යි කෙසෙය් සිතෙ (ය්)
කළ (යහ) ගී අසා මෙය්
බෙයන්ද්හි රන්වනන් අත ලු
දෙපෙති මහනෙල්මලින් මල්

ආ.

සල නෙතිනුනා බැලූ මෙ ද තුරු පුල් වමියෝ
වන දෙව් දූ විලස් හා දන නෙතෙහි පිරිමැදියෝ

සැදූ මෙ ද නිරිඳු උරබිත් එකක් පල්ලෙන්
හිද බඳනා ඕහු තමා නුරා තර පස හා පෑ

එකක් නැමී පුල් ලැහැබෙක්හි අත ලා බිඟු
වැලනුඩු නැගෙත බා මද දියසුන් සැව් සිරි දැරූ

ඇ.

නඳ දෙන ලෙව් නුවන් නව සඳ කලාවන්
දෙන තිළිණෙන් සියු දිව් වැසි වලාවන්
මුනි බණ කෙසර තෙල් යුතු රන මලාවන්
දැනැ ගති මෙ හිමි ලොවැ සූ සැට කලාවන්

අරුණු සරණ තල ගජ වන් ගමන් යුතු
කමල් කල් වුවන් රස පිය බස් නුමුතු
වදුරවි නුවණ සොමි ගුණ මෙ නිරිඳු දිමුතු
සව් දෙව් රුසිරි එක තැනැ මැවු වැනි අමුතු

හෙ සඳැ කිමැ මුහුද කිමැ සැඟවෙනු වෙලත
මෙ ගජ හය අතින් පැරකුම් රජ දිමුත
දෙයි ගිපිඳුන් ඕහු මඳ හස කැරැ ලවත
තදුන් කැලුම් සොමි ගුණ යුතු පඬුරු ඇත

ඈ.

බෝ මැඩ විදුර සුන්
අරා වඩමින් විද සුන්
පිළිවිද සිව් ස සුන්
පසුන් කර මරු සමඟ කෙලෙ සුන්

බුදුව දැන සච්නේ
තුටුව පල සම වතිනේ
ගොසින් ඉසි පතනේ
උතුම් දම්සක් පවත් වමිනේ

බව රැ කෙලෙස් සඳ
කිරණින් මුහුද බඹ සඳ
පියුම් වන එම සඳ
දෙසුම් රිවිගෙන් පුබුදුවා සෙද

(ලකුණු 10 x4 = 40)

## II කොටස

02. කලාත්මක පරිකල්පනයෙහි ලා සීගිරි කවීන් පළ කළ කුසලතාව කෙබඳු දැ යි සනිදර්ශනව විභාග කරන්න.

03. පොළොන්නරු යුගයේ පද්‍ය සාහිත්‍යය පිළිබඳ විමර්ශනයක් කරන්න.

04. කව්සිළුමිණ සිංහල මහා කාව්‍ය අතර විශිෂ්ටත්වයට පත්වීමට බලපෑ සාධක පිළිබඳ සමාලෝචනයක් කරන්න.

05. ''සිංහල ප්‍රශස්ති කාව්‍ය සාහිත්‍යයේ අග්‍ර ඵලය පැරකුම්බා සිරිතයි.'' නිදර්ශනාශ්‍රයෙන් සනාථ කරන්න.

06. ගුත්තිල කාව්‍ය කතුවරයා සතු අවස්ථා නිරූපණ ශක්‍යතාව කෙබඳු දැ යි නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

## III කොටස

07. සංස්කෘත කාව්‍ය විචාරයේ ප්‍රභවය හා විකාසනය පිළිබඳ සමාලෝචනයක් කරන්න.

08. පහත සඳහන් විචාරවාද අතුරින් දෙකක් පිළිබඳ සංක්ෂිප්ත විවරණ සපයන්න.

i. රසවාදය ii. අලංකාරවාදය iii. ධ්වනිවාදය iv. ඖචිත්‍යවාදය

09. නූතනවාදී සාහිත්‍ය නිර්මාණ බිහිවීමට බලපෑ සමාජ, දේශපාලන හා ආර්ථික පසුබිම පිළිබඳව විග්‍රහයක් සපයන්න.

10. ''තත්කාලීන සමාජ සංස්කෘතික හා දේශපාලන විඥානයේ කලාත්මක ප්‍රතිබිම්බයක් ලෙස බටහිර අද්භූත සෞන්දර්යවාදය හැඳින්විය හැකිය.'' නිදසුන් සපයමින් විභාග කරන්න.

(02 සිට 10 තෙක් සෑම පිළිතුරකට ම ලකුණු 15 බැගිනි.)

**********************************